Department of Education Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 8

ශ්‍රේණිය - 12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 4.0 – මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 4.1 - මූලික සටහන් පොත් පවත්වා ගෙන යාමේ වැදගත්කම විග්‍රහ කරයි.

<u>**ප්‍රභව ලියවිලි/මූලාශ්‍ර ලේඛන -**</u> ව්‍යාපාරවල සිදුවන විවිධ ගනුදෙනුවලට අදාළ විස්තර ඇතුළත් කරමින් නිකුත් කරන ලියවිලි ය.මූලාශ්‍ර ලේඛන පදනම් කර ගෙන,ගනුදෙනුවල ස්වභාවය අනුව පහත දැක්වෙන මූලික සටහන් පොත් ව්‍යාපාර විසින් පවත්වා ගෙන යයි.

1.මුදල් ලැබීම් ජර්නලය/ලැබීම් ජර්නලය
2.මුදල් ගෙවීම් ජර්නලය/ගෙවීම් ජර්නලය
3.සුළු මුදල් ගෙවීම් ජර්නලය
4.ගැනුම් ජර්නලය
5.ආපසු යැවුම් ජර්නලය
6.විකුණුම් ජර්නලය
7.ආපසු එවුම් ජර්නලය
8.පොදු ජර්නලය

මූලික සටහන් පොත් උපයෝගී පොත්,ජර්නල් යනාදී නම්වලින්ද හඳුන්වයි.

<u>**අභ්‍යාස**</u>

1.මූලාශ්‍ර ලේඛන හා මූලික සටහන් පොත්වල වැදගත්කම පැහැදිලි කරන්න.
2.පහත වගුව සම්පූර්ණ කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | මූලික පොත |
|---|---|---|
| 1.මුදල් හා චෙක්පත් ලැබීම | | |
| 2.බැංකු ගිණුමෙන් ගෙවීම. | | |
| 3.ව්‍යාපාරයේ ස්වභාවය මත සුළු ගෙවීම් | | |
| 4.වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම. | | |
| 5.වෙළෙඳ භාණ්ඩ ආපසු යැවීම. | | |
| 6.වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම. | | |
| 7.වෙළෙඳ භාණ්ඩ ආපසු එවීම. | | |
| 8.අනිකුත් මූලික සටහන් පොත්වල සටහන් නොවූ ගනුදෙනු | | |